# ලංකා බැංකුව

**ශ්‍රී ලංකාවේ අංක 01 බැංකුව සමග එක් වී ඩිජිටල් අලෙවිකරණ ඒකකයෙහි පෙරමුණ ගන්න.**

ලංකා බැංකුවෙහි ඩිජිටල් අලෙවිකරණ ඒකකයෙහි කොටස්කරුවකු වීමට කැමති සුදුසුකම් සහිත තරුණ ජවසම්පන්න සහ ප්‍රතිඵල කරා දිශාභිමුඛ වූ පුද්ගලයන්ගෙන් පහත සඳහන් තනතුර සඳහා අයදුම්පත් කැඳවනු ලැබේ.

## කළමනාකරු - ඩිජිටල් අලෙවිකරණ (කොන්ත්‍රාත් පදනම මත)

### ප්‍රධාන වගකීම්

1. ඩිජිටල් උපායමාර්ග සංවර්ධනය: බැංකුවේ ඉලක්කවලට අනුකූලව ඩිජිටල් අලෙවිකරණ උපායමාර්ග නිර්මාණය කර ක්‍රියාත්මක කිරීම සඳහා අලෙවිකරණ කණ්ඩායම සමග සහයෝගයෙන් කටයුතු කිරීම.
2. අන්තර්ගත නිර්මාණය සහ කළමනාකරණය : වෙබ් අඩවි, බ්ලොග් සහ සමාජ මාධ්‍ය සඳහා ආකර්ෂණීය අන්තර්ගතයන් නිර්මාණය කිරීම සහ අනාගත සිසුන් ඉලක්ක කරගත් විශේෂ ප්‍රචාරණ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.
3. සමාජ මාධ්‍ය කළමනාකරණය : Facebook, Instagram, LinkedIn සහ Twitter වැනි සමාජ මාධ්‍ය ජාලාවන්හි බැංකුවේ පැවැත්ම අධීක්ෂණය කිරීම, පරිශීලකයන්ගේ සන්නිවේදනය වැඩි කිරීමට හා උනන්දුවක් දක්වන පරිශීලකයන් ආකර්ෂණය කරගැනීම සඳහා උපායමාර්ගිකව සැලසුම් කිරීම සහ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.
4. සෙවුම් යන්ත්‍ර ප්‍රශස්තිකරණය (Search Engine Optimization-SEO): මූල පද පර්යේෂණ පැවැත්වීම, වඩා හොඳ සෙවුම් ශ්‍රේණිගත කිරීම් සඳහා අන්තර්ගතය ප්‍රශස්ත කිරීම සහ SEO කාර්යසාධනය නිරීක්ෂණය කිරීම.
5. ගෙවන ලද වෙළෙඳ දැන්වීම් : Pay-Per-Click (PPC) වැඩසටහන් (Google දැන්වීම්, Facebook දැන්වීම්) කළමනාකරණය කිරීම, කාර්යසාධනය, නිරීක්ෂණය කිරීම සහ පරිශීලකයන්ගේ ප්‍රතිශතය වැඩි කිරීම.
6. ඊමේල් මගින් ප්‍රචාරණ කටයුතු සිදු කිරීම : සිසුන් සඳහා ඊමේල් ආශ්‍රිත වැඩ සටහන් නිර්මාණය කිරීම සහ කළමනාකරණය කිරීම, කණ්ඩායම් නිර්මාණය කිරීම සහ එහි ප්‍රතිඵල නිරීක්ෂණය කිරීම.
7. විශ්ලේෂණ සහ වාර්තාකරණය : Google Analytics වැනි මෙවලම් භාවිතයෙන් ඩිජිටල් නාලිකා හරහා KPI නිරීක්ෂණය කර කාර්යසාධන දත්ත මත පදනම්ව වැඩසටහන් ප්‍රශස්ත කිරීම.
8. වෙබ් අඩවි කළමනාකරණය : වෙබ් අඩවිය නඩත්තු කිරීම සහ යාවත්කාලීන කිරීම, එය භාවිත කිරීමට පහසු, ජංගම දුරකථනය මගින් පහසුවෙන් ප්‍රවේශ විය හැකි මෙන්ම යහපත් SEO පරිචයන් අනුගමනය කරන බව සහතික කිරීම.
9. සන්නාම කළමනාකරණය: සියලු ඩිජිටල් මාධ්‍ය හරහා සන්නාමකරණය සහ අදාළ සන්නාමයන්හි ප්‍රචාරණ කටයුතු සිදු කිරීම.
10. ගණුදෙනුකාර උනන්දුව ඇති කිරීම : අනාගත පරපුර අදාළ සමාජ මාධ්‍ය ජාලාව වෙත ආකර්ෂණය කරගැනීම සඳහා උපාය මාර්ගික සැලසුම් නිර්මාණය කිරීම හා ඔවුන්ගේ තොරතුරු එක් රැස්කිරීම හා සමාජ මාධ්‍ය වැඩසටහන් මගින් නිරන්තරයෙන් ඔවුන් හා සන්නිවේදනයේ යෙදීම.

## යෝග්‍යතා නිර්ණායක

- **ශ්‍රී ලාංකීය පුරවැසියකු විය යුතුය.**
- **සුදුසුකම්**
  - අලෙවිකරණය පිළිබඳ ශාස්ත්‍රවේදී/විද්‍යාවේදී උපාධියක් තිබීම. අදාළ ක්ෂේත්‍රයේ ශාස්ත්‍රපති/විද්‍යාපති උපාධියක් තිබීම අමතර සුදුසුකමක් වනු ඇත.
  - තොරතුරු තාක්ෂණය පිළිබඳ උපාධියක් හෝ ඩිජිටල් අලෙවිකරණය පිළිබඳ ඩිප්ලෝමාවක් ලබා ඇති අයදුම්කරුවන්ට ප්‍රමුඛතාව දෙනු ලැබේ.
- **පළපුරුද්ද**
  - ඩිජිටල් අලෙවිකරණ ක්ෂේත්‍රයේ අවම වශයෙන් වසර දෙකක (02) පශ්චාත් සුදුසුකම් ලැබීමේ පළපුරුද්ද තිබිය යුතුය.
- **අනෙකුත් ගුණාංග**
  - ඉංග්‍රීසි සහ සිංහල/දෙමළ භාෂාවන් චතුර ලෙස හැසිරවීමේ හැකියාව.
  - වෙබ් අඩවි, සමාජ මාධ්‍ය සහ අදාළ ක්ෂේත්‍ර පිළිබඳ ගැඹුරු අවබෝධයක් සහ ක්‍රියාකාරී දැනුමක් තිබිය යුතුය.
- **වයස**
  - අයදුම්පත් භාරගන්නා අවසාන දිනට වයස අවුරුදු 45 හෝ ඊට අඩු විය යුතුය.

## නියමයන් හා කොන්දේසි

- සම්පූර්ණ කොන්ත්‍රාත් කාල සීමාව අවුරුදු 03කි (කාර්යසාධනය වාර්ෂිකව සමාලෝචනය කෙරේ).
- අයදුම්කරුගේ සුදුසුකම්, නිපුණතා සහ අත්දැකීම මත පදනම්ව ආකර්ෂණීය වැටුප් පිරිනමනු ලබන අතර එය සාකච්ඡා කර තීරණය කළ හැක.

## තෝරාගැනීමේ පටිපාටිය

- ඉහත දැක්වූ යෝග්‍යතා නිර්ණායකයන්ට අනුව කෙටි ලැයිස්තුගත කරනු ලබන අයදුම්කරුවන් සම්මුඛ පරීක්ෂණ ක්‍රියාවලියක් මගින් තෝරාගනු ලැබේ.

## අයදුම් කිරීමේ පටිපාටිය

අපගේ වෙබ් අඩවිය වන www.boc.lk ("careers" තීරය) යටතේ බාගත කළ හැකි ආදර්ශ අයදුම්පත භාවිතයෙන් සකසන ලද ඔබගේ ජීවදත්ත පත්‍රිකාව, ඔබගේ උප්පැන්න සහතිකයේ, ජාතික හැඳුනුම්පතේ, සියලුම අධ්‍යාපනික හා වෘත්තීය සහතිකපත්වල සහ පළපුරුද්ද සනාථකිරීමේ සහතික/ලේඛනවල ඡායාස්ථ පිටපත් සමඟ **2025.12.13 වන දින හෝ ඊට පෙර** අප වෙත ලැබෙන සේ පහත ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් යොමු කළයුතු අතර, අයදුම්පත බහා එවන ලියුම් කවරයේ වම් පස ඉහළ කෙළවරේ ඔබ අයදුම් කර ඇති තනතුර ද සඳහන් කළ යුතුය.

*අයදුම්පත් භාරගන්නා අවසන් දිනට ඉහත නියමිත යෝග්‍යතා නිර්ණායක සපුරා නොමැති හෝ අදාළ සනාථ කිරීමේ ලේඛනවල ඡායාස්ථ පිටපත් නොමැතිව හෝ සාවද්‍ය තොරතුරු ඉදිරිපත් කරන හෝ අයදුම්පත් භාරගන්නා අවසන් දිනට පසුව එවන ඕනෑම අයදුම්පතක් කිසිදු දැනුම්දීමකින් තොරව බඳවාගැනීමේ ඕනෑම අදියරක දී ප්‍රතික්ෂේප කරනු ලැබේ.*

*අයදුම්කරු බැංකුවේ වෙබ් අඩවියේ මානව සම්පත් කළමනාකරණ වෙබ් පිටුව වන https://www.boc.lk/hr-management යන වෙබ් පිටුවේ ඇති "Personal Data Protection Notice for Recruitment" යන්න කියවා පුරප්පාඩුව සඳහා අයදුම් කරන විට එය පිළිගත යුතුය.*

**ප්‍රධාන කළමනාකරු (බඳවාගැනීම් හා වෘත්තීය සංවර්ධන)**
**ලංකා බැංකුව, 26 වන මහල, ප්‍රධාන කාර්යාලය,**
**ලංකා බැංකු චතුරස්‍රය, අංක 1, ලංකා බැංකු මාවත,**
**කොළඹ 01.**

- *බැංකුව වෙත කිසිම ආකාරයක බලපෑමක් කිරීම ඔබ මෙම තනතුර සඳහා වහාම නුසුදුසුභාවයට පත් කිරීමට හේතු වේ.*
- *තෝරාගනු ලබන අයදුම්කරුවන් පමණක් කැඳවීමේ අයිතිය බැංකුව සතුය.*
- *සම්පූර්ණ කළ යුතු තනතුරු සංඛ්‍යාව හෝ බඳවාගැනීම කල්දැමීමේ/ අවලංගු කිරීමේ අයිතිය බැංකුව සතුය.*
- *බැංකුවේ පෞද්ගලික දත්ත ආරක්ෂණ ප්‍රතිපත්තියට අනුව, බැංකුව විසින් ඔබේ තොරතුරුවල පෞද්ගලිකභාවය හා රහස්‍යභාවය ආරක්ෂා කරනු ලැබේ.*

1975 BOC CALL CENTRE
www.boc.lk
AA-(lka) Fitch ශ්‍රේණිගත කිරීම. සන්නාම ශ්‍රේණිගත කිරීම: AAA- (Brand Finance Lanka)
ලංකා බැංකුව, ශ්‍රී ලංකා මහ බැංකුව විසින් අධීක්ෂණය කරනු ලබන බලපත්‍රලාභී වාණිජ බැංකුවකි.
යෝජනා/අදහස්/පැමිණිලි සඳහා - https://www.boc.lk/contact
ප්‍රධාන කාර්යාලය, BOC චතුරස්‍රය, අංක 1, ලංකා බැංකු මාවත, කොළඹ 1.
ලංකා බැංකුව BOC
ජාතියේ මහා පහන් ටැඹ